# මූල්‍ය ක්ෂේත්‍රය
# (Finance Sector)

**ඔබ ගණිතයට දක්ෂ ද? ඔබ අංක සමඟ වැඩ කිරීමට කැමතිද ?**

මූල්‍ය ක්ෂේත්‍රයේ පුද්ගලයෝ මුදල් ගැන සොයා බලති. ඔබට මූල්‍ය සැලසුම්කරණය, බැංකුකරණය හෝ රක්ෂණය ආයතන තුළ වැඩ කළ හැකිය.

උදාරණයක් ලෙස ඔබට ව්‍යාපාරයකට හෝ පුද්ගලයකුට මූල්‍ය සේවා සැපයිය හැකිය. එසේත් නැතිනම් ඔබට මූල්‍ය වාර්තා පවත්වාගෙන යාමට හෝ ව්‍යාපාර විධායකයන්ට ඔවුන්ගේ ව්‍යාපාරය කරගෙන යන ආකාරය පිළිබඳ උපදෙස් ලබා දිය හැකිය.

**මූල්‍ය ක්ෂෙත්‍රයේ රැකියා/ වෘත්ති,**

**1. ගණකාධිකාරී/ විගණක**
මූල්‍ය උපදෙස් ලබා දීම සඳහා අයවැය ප්‍රකාශ අර්ථකනය කරන්නා.

**2. සංඛ්‍යා දත්ත ක්‍රියාකරු (Actuarie)**
අවදානම් හැකියාව පුරෝකථනය කිරීම සඳහා සංඛ්‍යාන දත්ත විශ්ලේෂණය කරන්නා.

**3. වාහන හානි රක්ෂණ තක්සේරුකරු**
අලුත්වැඩියාව සඳහා කොපමණ මුදලක් වැය වේ ද යන්න තීරණය කිරීම සඳහා වාහනයේ හානිය පරීක්ෂා කරන්නා.

**4. බිල්පත් සහ ගිණුම් එකතුකරන්නා**
බිල්පත් ඇති පුද්ගලයන්ගෙන් ගෙවීම් ලබා ගැනීමට කටයුතු කරන්නා.

**5. තැරව්කාර ලිපිකරු**
කොටස් හෝ වෙනත් මූල්‍ය භාණ්ඩ මිලදී ගැනීම සහ විකිණීම සම්බන්ධ ලිපිකරු රාජකාරි ඉටු කරන්නා.

**6. අයවැය විශ්ලේෂක**
අයවැය සම්පූර්ණ සහ නිවැරදි බවට වග බලා ගන්නා.

**7. හිමිකම් ගැලපුම්කරු/ විමර්ශක**
ගෙවීම් නිසි ලෙස සිදු කර ඇති බවට සහතික කර ගැනීමට රක්ෂණ හිමිකම් සමාලෝචනය කරන්නා.

**8. ණය විශ්ලේෂක**
පුද්ගලයන්ට හෝ නව ව්‍යාපාරවලට මුදල් ණයට ලබා දීම සඳහා මූල්‍ය තොරතුරු සමාලෝචනය කරන්නා.

**9. මූල්‍ය විශ්ලේෂක**
ව්‍යාපාරවල ආයෝජනවලට බලපාන තොරතුරු විශ්ලේෂණය කරන්නා.

**10. මූල්‍ය කළමනාකරු**
සංවිධානයක මූල්‍ය ක්‍රියාකරකම් සැලසුම් කිරීම සහ කළමනාකරණය කිරීම.

Guidance & Counselling Unit, NIE, Maharagama